ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 4 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 1 - 2006

අපරාධ නීතිය - **LWU 2312**

කාලය - විනාඩි හතලිහයි.

---

දිනය - 2006.09.04 වේලාව - ප.ව.01.30 - ප.ව.02.10 දක්වා

---

*අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.*
*එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.*

01. "සදෝෂී මානසික ධාතුව යන සංකල්පය වූ කලී දණ්ඩ නීති සංග්‍රහයේ දක්වා ඇති වරදවල් සහ වෙනත් අවස්ථාවල දක්වා ඇති වරදවල් යන දෙවර්ගයටම අදාල වන්නා වූ සියළු අංග ලක්ෂණ ඇතුලත් මූල ධර්මයකි."

ඔබ මෙම ප්‍රකාශය සමග එකඟ වන්නේ ද ?
දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන සහ අදාල නඩු තීන්දු ඇසුරෙන් සාකච්ඡා කරන්න.

02. පහත සඳහන් අවස්ථාවලදී X,Y සහ Z ට අදාල වන්නා වූ යම් විත්තිවාචක ඇත්නම් ඒවා මොනවා ද?
අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන සහ විනිශ්චිත නඩු තීරණ ඇසුරින් සාකච්ඡා කරන්න.

(අ) යුද්ධ හමුදාවේ ස්වේච්ඡා භටයකු වන X , සිය හමුදා අණදෙන නිලධාරියාගේ උපදෙස් මත අහිංසක, නිරායුධ වැසියකුට වෙඩි තබයි.

(ආ) මෝටර් සයිකලයේ පිටුපස අසුනේ ගමන් කිරීම සම්බන්ධයෙන් පනවා තිබූ මාර්ග ප්‍රවාහන නීතියක් කඩ කිරීම සම්බන්ධයෙන් Y ට චෝදනා කළ විට, ඔහු කියා සිටින්නේ එවැනි තහනමක් ක්‍රියාත්මක වන බව තමා නොදැන සිටි බවයි.

(ඇ) අවුරුදු 11 ක් වයසැති ළමයකු වන Z , සාප්පුවකට ඇතුළු වී සෙල්ලම් පිස්තෝලයක් සොරකම් කරයි.

- හිමිකම් ඇවිරිණි. -